අ. පො. ස. උසස් පෙළ ඉංග්‍රීසි භාෂාව විෂයයක් වශයෙන් හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

*සටහන.*— උපාධියකට අදාළ විභාගයක ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින කිසිම අයෙකුට මෙම විභාගයට පෙනී සිටීමට නොහැක. කෙසේ වුව ද පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සමත් වූ අයෙකුට ඔහු/ඇය එම උපාධි විභාගය සමත් වූ බවට එම විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරිගෙන් ලබාගත් නිල ලිපියක් ඉදිරිපත්කළ අවස්ථාවක දී මෙම විභාගයට පෙනී සිටීමට අවසර දිය හැකිය.

03. *සේවා කොන්දේසි* :—

(i) වැටුප:— මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ.:—

රා. ප. චක්‍රලේඛ අංක : 6/2006 (iv) — MN5-2006A
රු. 16,720 - 320 x 10 - 365 x 11 - 450 x 15 — රු. 30,685

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

(iii) තෝරාගත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පත්වීමේ දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

(iv) පත්වීම් ලබන්නන්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද, නැද්ද යන්න පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

(v) පත්වීම් ලබන්නන්ට දිවා රෑ දෙකේදීම සේවය කිරීමට සිදුවිය හැක. එමෙන්ම ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට ද බැඳී සිටිය යුතු ය.

(vi) මෙම *ගැසට්* පත්‍රයේ I වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත්කිරීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කෙරේ.

04. *විභාග පරිපාටිය* : බඳවා ගැනීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ. :—

| | |
|---|---|
| (i) අභියෝග්‍යතාව පරීක්ෂණය (පැය 01 යි) | ලකුණු 100 යි |
| (ii) ඉංග්‍රීසි භාෂාව (පැය 1 1/2 යි) | ලකුණු 100 යි |
| *එකතුව* | 200 යි |

අභියෝග්‍යතාව ප්‍රශ්න පත්‍රය.— මෙම ප්‍රශ්න පත්‍රයට අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ භාෂා ප්‍රවීණත්වය හා තර්කන ශක්තිය මැනීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රය.— අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම, අවබෝධය හා සන්නිවේදන හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස්වූවකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

*සටහන*.—මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. විභාගයට පෙනී සිටිය යුතු වන්නේ මෙම නිවේදනයේ 02 (iii) අනුව සුදුසුකම් ලබන විභාගයට තමන් පෙනී සිටි භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) නොපැහැදිලි අත් අකුරු සහ වැරදි අක්ෂර වින්‍යාසයට ද ලකුණු අඩු කරනු ලැබේ.

(ii) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කර ඇති අපේක්ෂකයින්ට/අපේක්ෂිකාවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. එහෙත් විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබීම, විභාගය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැළකිය යුතු ය.

(iii) *ඇගයීමේ ක්‍රමය*.- තරග විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 60%ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ලකුණුවල එකතුවට අනුව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ඔවුන් අතරින් ඉහළම ලකුණු ලබාගත් අපේක්ෂකයාගේ සිට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුපාතිකව අපේක්ෂකයින් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. එහිදී ක්‍රීඩා කුසලතා සඳහා ලකුණු 10ක් ලබා දෙනු ලබන අතර, පසුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට ද යොමු කෙරේ. එහිදී අපේක්ෂකයින්ට ලකුණු ලබාදීමක් සිදු නොවන අතර, සුදුසුකම් පිළිබඳව ඉදිරිපත් කර ඇති තොරතුරුවල සත්‍යතාව වැනි කරුණු මෙහි දී පරීක්ෂා කරනු ලැබේ.

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පිළිවෙල*.— කලාප මට්ටමේ ක්‍රීඩා තරග ප්‍රථම ස්ථානයට ලකුණු 3 යි. දෙවැනි ස්ථානයට ලකුණු 2 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 1 යි.

දිස්ත්‍රික් මට්ටමේ දී ප්‍රථම ස්ථානයට ලකුණු 4 යි. දෙවැනි ස්ථානයට ලකුණු 3 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 2 යි.

ජාතික මට්ටමේ දී ප්‍රථම ස්ථානයට ලකුණු 5 යි. දෙවැනි ස්ථානයට ලකුණු 4 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 3යි.

කලාප තරගවලදී කණ්ඩායමක සාමාජිකයෙකුහට පළමු ස්ථානය දිනූ කණ්ඩායමක සාමාජිකයෙකු නම් ලකුණු 3යි. දෙවැනි ස්ථානයට ලකුණු 2යි. තුන්වැනි ස්ථානය සඳහා ලකුණු 1 බැගින් ලබා දෙනු ලැබේ.

දිස්ත්‍රික් තරගවල දී කණ්ඩායමක සාමාජිකයෙකුහට පළමු ස්ථානය දිනූ කණ්ඩායමක සාමාජිකයෙකු නම් ලකුණු 4 යි. දෙවැනි ස්ථානය සඳහා ලකුණු 3යි. තුන්වැනි ස්ථානය සඳහා ලකුණු 2 බැගින් ලබා දෙනු ලැබේ.

ජාතික මට්ටමේ තරගවල දී කණ්ඩායමක සාමාජිකයෙකුහට පළමු ස්ථානය දිනූ කණ්ඩායමක සාමාජිකයෙකු නම් ලකුණු 5යි. දෙවැනි ස්ථානයට ලකුණු 4යි. තුන්වැනි ස්ථානය සඳහා ලකුණු 3 බැගින් ලබා දෙනු ලැබේ.

05. *තෝරා ගැනීමේ පදනම*.— ලිඛිත විභාගයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් අදළ බඳවා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමත කර ඇති පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව පත්වීම් පිරිනැමීම සඳහා තෝරාගනු ලබන අතර, පුරප්පාඩුවලින් 10%කට නොවැඩි ප්‍රමාණයක් අපේක්ෂිකාවන් සඳහා වෙන් කෙරේ.

05. (I) *ප්‍රතිඵල නිකුත් කිරීම*.— ලිඛිත පරීක්ෂණයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ගේ ලිඛිත විභාග ලකුණු හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ලකුණු එකතුව මත ප්‍රමුඛතාවය අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් හෝ www.results. exams.gov.lk නිල වෙබ් අඩවිය හරහා හෝ ප්‍රතිඵල දැනුම්දීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ.

*සටහන*.—රේගු දෙපාර්තමේන්තුවේ රාජකාරි ස්වභාවය අනුව කාන්තා නිලධාරීන්ට ද සේවා මුර ක්‍රමය අනුව රාත්‍රී සේවා මුරයන් හි සේවය කිරීමට සිදුවනු ඇත.

06. සෑම අයදුම්කරුවෙකු ම තනතුරට අදාල සියලුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

07. *ඉල්ලුම් කිරීමේ පිළිවෙල* :

(i) *ආදර්ශ අයදුම්පත* .—මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇත. අයදුම්කරුවන් විසින් මෙකී ආදර්ශ අයදුම්පත තමා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන් ම පිළියෙල කළ යුතු අතර, එය තමන්ගේ ම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පතේ සෑම වගන්තියක්ම උපදෙස් දී ඇති පරිදි ම අයදුම්කරු විසින් පිරවිය යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා "අදාළ නොවේ" යනුවෙන් සටහන් කළ යුතු ය. අයදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේම සිහි තබා ගත යුතු ය. (ආදර්ශ අයැදුම්පත්‍රයේ 01 සිට 05 තෙක් ශීර්ෂ 1 වැනි පිටුවට ද, 06 සිට 10 තෙක් ශීර්ෂ දෙවැනි පිටුවේ ද, ඉතිරිය තුන්වැනි පිටුවට ද, වන සේ A 4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන්න). ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීමේ දී විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) අයදුම්පත් 2016 මාර්තු 14 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ" ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත්‍රය බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(iii) විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13 යටතේ ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට පමණක් විභාග ගාස්තු වශයෙන් රුපියල් 750 ක මුදලක් ගෙවා ලබාගත් ලදුපත අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබාගැනීම ඉතාම යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථා ආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අපේක්ෂකයින් තමන්ගේ අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය. 2016 මාර්තු 14 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමක් ද සමග ස්වකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට අයදුම්පත් නොඑවිය යුතු ය. දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කරන අයදුම්පත් වුව ද නියමිත දිනට පසුව ලැබුණහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව තබා නොමැති නම් එම අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

(v) *සහතික කිරීම*.-දැනට රජයේ සේවයේ යෙදී සිටින අයැදුම්කරුවකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි. අනිකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතු ය. එනම් සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයෙකු, නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, නාවික, ගුවන්, හෝ යුධ හමුදාවක කොමිෂන්ලත් නිලධාරියෙකු, වාර්ෂිකව රු. 2,40,360 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු විය යුතු ය.

08. (*i*) *විභාග ප්‍රවේශ පත්‍ර*.— ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග විභාග යට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීමද, අදල නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට විභාග දෙපාර්තමේන්තුව වෙත ඒ පිළිබඳව දන්වා සිටිය යුතු ය. එහිදී අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් ඉහත විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වේ. එහිදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සූදානමින් තබාගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

(ii) *විභාගයට ඇතුළත් කර ගැනීම*.—විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂයෙක්ම විභාග ප්‍රවේශ පත්‍රයේ තමාගේ අත්සන සහතික කරවා ගත යුතු අතර, නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින පළමු දිනයේම, විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. එසේ නොකරන අපේක්ෂකයෙකුට විභාගයට ඇතුළත් වීමට ඉඩ නොලැබෙනු ඇත. මෙම *ගැසට් පත්‍රයේ* පළමුවැනි කොටස (IIඅ) ඡේදයෙහි විභාග අපේක්ෂකයින් සඳහා සකස් වූ ව්‍යවස්ථා පළකොට ඇත. විභාග අපේක්ෂකයන් මෙම ව්‍යවස්ථා පිළිපැදීමට බැඳී සිටිති.

*සටහන* : විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අපේක්ෂකයකු විභාග යට පෙනී සිටීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකේ.

09. *අනන්‍යතාවය*.—අපේක්ෂකයින් විභාග ශාලව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවත් භාරගනු ලැබේ. :—

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

(ආ) මෙම විභාග දිනට අවුරුදු 05කට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්).

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයැදුම්කරුවන් හට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10. *සුදුසුකම් පිළිබඳ ලියවිලි* :

(i) අයදුම්පත සමග මුදල් තැන්පත් කළ ලදුපත හා අදාළ වේ නම්, ශීර්ෂ අංක 02හි 'සටහන' යටතේ දක්වා ඇති අවශ්‍යතාව

සඳහා වූ ලේඛනය හැර සහතිකපත්, ඒවායේ ඡායා පිටපත් හෝ වෙනත් කිසිදු ලිපි ලේඛනයක් නොඑවිය යුතු ය. එහෙත් නියම කොට ඇති පරිදි, අවශ්‍ය සියලුම, විස්තර අයැදුම්පතෙහි සඳහන් කළ යුතු ය. මෙසේ අවශ්‍ය වන කරුණුවලින් සම්පූර්ණ නොවන අයැදුම්පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අපේක්ෂකයින් ලියකියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාව ඔප්පු කළ යුතු ය.

(iii) පහත දැක්වෙන ලියකියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ.

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිව යුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

*සටහන.*—එම සහතිකය සමාදාන විනිශ්චයකාරවරයකු, නීතිඥවරයකු පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ වාර්ෂිකව රු. 2,40,360 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියක් දරන කෙලින්ම දන්වා තොරතුරු ලබාගත හැකි තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරකුගෙන් වුව ද ලබාගත හැකි වේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනය ද එහි පැහැදිලි ලෙස සඳහන්ව තිබිය යුතු ය. (රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් උසුලන අපේක්ෂකයන් විසින් යහපත් චරිතය පිළිබඳ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.).

(ආ) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියාපදිංචි නොකළ අපේක්ෂකයින් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

*සටහන්* .—(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික පත්‍ර උද්ධෘත භාරගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතිකය වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ. උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අපේක්ෂකයා/ අපේක්ෂිකාව සාමාන්‍යයෙන් භාවිත කරන, එසේම ඔහු/ඇය විභාගයේ දී පෙනී සිටින නම/නම් හා අතර, වෙනසක් වේ නම් උචිත පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි පරිච්ඡේදය) අංක 27 හෝ 28 දරන නියමයන් අනුව ස්වකීය උප්පැන්නයේ දැක්වෙන නම/නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතු ය.

(iii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් රජය මඟින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි).

(iv) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකයක් හෝ එසේ සහතිකයක් නිකුත් කොට නැත්නම් ඊට අදාළ වූ වෙනත් රාජකාරි ලියවිල්ලක් එනම්, අපේක්ෂකයා උපාධි විභාගය සමත් බවට විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරී විසින් නිකුත් කරන ලද නිල ලියවිල්ලක් හා විභාග දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව සමත් වූ බවට නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව සමත් වූ බවට නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනය.

(v) කලාප/දිස්ත්‍රික්/ජාතික මට්ටමේ ක්‍රීඩා තරගවලදී දැක් වූ කුසලතා සම්බන්ධ ලේඛන.

(vi) ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී අවශ්‍ය සියලුම ලියකියවිලි සූදානම් කොට තබා ගන්නා ලෙස අපේක්ෂකයින්ට අවවාද කරනු ලැබේ. ඉල්ලා සිටි විටෙක අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාද කරන අපේක්ෂකයකු වෙතොත් ඔහු මෙම තනතුරට පත් කිරීමට නුසුදුස්සෙකු කරනු ලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම.*—මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකුට, ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ කවර අවස්ථාවක දී වුව ද, ඔහුගේ/අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකි ය. අපේක්ෂකයකු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත්, හෝ එයම ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපයා නොමැති අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

13. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පැන නැගුනහොත් එවැනි විටෙක දී සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

රේගු අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
රේගු මන්දිරය,
අංක 40,
කෙළින් වීදිය,
කොළඹ 11.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම් පත්‍රය**

***ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරී තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2016***

Open Competitive Examination for Recruitment to Posts of Assistant Superintendent of Customs, Grade II of Sri Lanka Customs Department - 2016

විභාගයට පෙනී සිටින භාෂා මධ්‍යය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
(*උදා.*- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුව දා යොදු නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
(*උදා* : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.

02. ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ජාතික හැඳුනුම්පත පිළිබඳ විස්තර :

3.1 හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

3.2 නිකුත් කළ දිනය : [ ]

04. ස්ත්‍රී/පුරුෂ භාවය : [ ]
පුරුෂ - 0
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ :
පරම්පරාවෙන් - 1
ලියාපදිංචියෙන් - 2 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

06. ජනවර්ගය :
සිංහල 1
ලංකා දෙමළ 2
ඉන්දියානු දෙමළ 3 [ ]
මුස්ලිම් 4
බර්ගර් 5 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
වෙනත් 6

07. උපන් දිනය :

(*අ*) අවුරුද්ද : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

(*ආ*) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

08. ශාරීරික යෝග්‍යතාවය :
(i) උස : අඩි ………… අඟල් …………

(ii) පපුව (ප්‍රසාරණය කළවිට) : අඟල් …………
(පිරිමි අයදුම්කරුවන්ට පමණයි.)

09. ඔබ කවදා හෝ උසාවියකින් වැරදිකරුවකු වී තිබේ ද? ඔව්/නැත
"ඔව්" නම් විස්තර සඳහන් කරන්න. :—————.

10. *අධ්‍යාපන සුදුසුකම්* :

| *විශ්වවිද්‍යාලයේ නම* | *උපාධිය* | *උපාධියේ පංතිය* | *වර්ෂය* | *විෂයයන්* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

(i) අ. පො. ස. (සා. පෙළ.) ඉංග්‍රීසි විෂයයට ලබා ඇති ඉහළම සාමාර්ථ්‍යය : [ ]

වර්ෂය :—————.
විභාග අංකය :—————.

(ii) අ. පො. ස. (උ. පෙළ.) ඉංග්‍රීසි විෂයයට ලබා ඇති ඉහළම සාමාර්ථ්‍යය : [ ]

වර්ෂය :—————.
විභාග අංකය :—————.

11. විභාග ගාස්තුව (ලදුපත අමුණා එවිය යුතු ය)

(i) ගෙවන ලද තැපැල්/උප තැපැල් කාර්යාලය :—————.
(ii) ගෙවූ මුදල :—————. (iii) ගෙවූ දිනය :—————.
(iv) ලදුපතේ අංකය :—————.

(මෙහි සඳහන් විස්තර අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතු ය)

ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

12. *අයදුම්කරුගේ ප්‍රකාශය/සහතිකය* :

මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සඳහන් කර තිබෙන සියලු විස්තර සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව, ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : (අදාළ නොවන වචන කපා හරින්න).

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................... නමැති මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ......................... මස ............... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන :————.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

දිනය :————.

සටහන : අයැදුම්පත සහතික කළ යුත්තේ *ගැසට්* නිවේදනයේ 7 (V) ඡේදයේ සඳහන් පරිදිය.

14. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................... මහතා/ මහත්මිය/මෙනෙවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු වන අතර, ඔහු/ඇය ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කල හැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාව)

දිනය :————.

ආයතන ප්‍රධානියාගේ නම :————.

තනතුර :————.

සේවා ස්ථානයේ ලිපිනය :————.

02-306

---

**මුදල් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වන ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2016**

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2016 මැයි මාසයේදී දිවයින පුරා පිහිටි පහත දැක්වෙන ප්‍රධාන නගර වලදී පමණක් පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය යථා කාලයේදී පුවත්පත් මගින් දැනුම් දෙනු ඇත. මෙකී විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය රේගු අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන නගර හා නගර අංක —

| *පළාත* | *නගරය* | *නගර අංක* |
|---|---|---|
| බස්නාහිර | කොළඹ | 01 |
| | ගම්පහ | 02 |
| | කළුතර | 03 |
| මධ්‍යම | මහනුවර | 04 |
| | මාතලේ | 05 |
| | නුවරඑළිය | 06 |
| දකුණු | ගාල්ල | 07 |
| | මාතර | 08 |
| | හම්බන්තොට | 09 |
| උතුරු | යාපනය | 10 |
| | මන්නාරම | 11 |
| | වව්නියාව | 12 |
| | මුලතිව් | 13 |
| | කිලිනොච්චිය | 14 |
| නැගෙනහිර | මඩකලපුව | 15 |
| | අම්පාර | 16 |
| | ත්‍රිකුණාමලය | 17 |
| වයඹ | කුරුණෑගල | 18 |
| | පුත්තලම | 19 |
| උතුරු මැද | අනුරාධපුරය | 20 |
| | පොලොන්නරුව | 21 |
| ඌව | බදුල්ල | 22 |
| | මොණරාගල | 23 |
| සබරගමුව | රත්නපුර | 24 |
| | කෑගල්ල | 25 |

කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පැවැත්වීමට තරම් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති නම් අයදුම්කරුගේ දෙවන තේරීම අනුව සඳහන් කර ඇති නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත එම අයදුම්කරුවන් යොමු කරනු ලැබේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් ම මෙම තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. යෝග්‍යතාව -

(i) සෑම අපේක්ෂකයෙකුම ඔහු/ඇය
- (අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු බවත්,
- (ආ) විශිෂ්ට චරිතයකින් යුත් අයකු බවත්,
- (ඇ) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 24 ට නොවැඩි බවත්, පිළිගත හැකි සාක්ෂිවලින් ඔප්පු කළ යුතුය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 1998.03.14 දින හෝ ඊට පෙර හා 1992.03.14 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

*සටහන* .— යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

(ii) *ශාරීරික යෝග්‍යතාවය* .— පිරිමි අපේක්ෂකයෙකුගේ උස අඩි 05 අඟල් 05 ට අඩු නොවිය යුතු අතර, පපුව ප්‍රසාරණය කළ විට පපුව අඟල් 33 ට නොඅඩු විය යුතුය.
(මෙය අපේක්ෂිකාවන් සඳහා අදළ නොවේ).
ගැහැණු අපේක්ෂිකාවන්ගේ උස අඩි 05 යි අඟල් 03ට නොඅඩු විය යුතුය.

(iii) *අධ්‍යාපන සුදුසුකම්* .— සෑම අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය. :-

(*අ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ප්‍රධාන විෂයයන් තුනකින් එකවර සමත්වීම.;

*සහ*

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ප්‍රධාන විෂයන් වශයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය යන විෂයන්ට සම්මාන සාමාර්ථ්‍යයන් සහිතව සම්මාන සාමාර්ථ්‍යයන් පහක්ද, ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06කින් සමත් විය යුතුය.

03 සේවා කොන්දේසි :

(i) වැටුප .— මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ. :—
රා.ප.චක්‍රලේඛ අංක : 6/2006 (iv) - R-S-1-2006
රු. 14,280 - 145 x 7 - 180 x 10 - 240 x 17 - රු. 21,175

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

(iii) තෝරාගත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පත්වීමේ දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

(iv) පත්වීම් ලබන්නන් විසින් තමන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද, නැද්ද යන්න පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

(v) පත්වීම් ලබන්නන්ට දිවා රෑ දෙකේදීම සේවය කිරීමට සිදු විය හැක. එමෙන්ම ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට ද බැඳී සිටිය යුතුය.

(vi) මෙම *ගැසට්* පත්‍රයේ I වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත් කිරීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කෙරේ.

04. *විභාග පරිපාටිය* .— බඳවා ගැනීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 03 කින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ :-

| | | |
|---|---|---|
| (i) | අභියෝග්‍යතාව (පැය 01 යි) | ලකුණු 100 යි |
| (ii) | ගණිතය (පැය 01 යි) | ලකුණු 100 යි |
| (iii) | ඉංග්‍රීසි භාෂාව (පැය 01 1/2යි) | ලකුණු 100 යි |
| | එකතුව | ලකුණු 300 යි |

*අභියෝග්‍යතා ප්‍රශ්න පත්‍රය* .— මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ භාෂා ප්‍රවීණත්වය, හා තර්කන ශක්තිය මැනීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

ගණිතය.— ගණිත හැකියාව මැනීම සඳහා සකස් වූවකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රය* .— අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ, ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම, අවබෝධය හා සන්නිවේදන හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි.

*සටහන* .—මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ මෙම නිවේදනයේ 02 (iii) අනුව සුදුසුකම් ලබන විභාගයට තමන් පෙනී සිටි භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) නොපැහැදිලි අත් අකුරු සහ වැරදි අක්ෂර වින්‍යාසයට ද ලකුණු අඩු කරනු ලැබේ.

(ii) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කර ඇති අපේක්ෂකයින්ට/අපේක්ෂිකාවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. එහෙත් විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබීම, විභාගය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැලකිය යුතු ය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(iii) *ඇගයීමේ ක්‍රමය* .— තරග විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 60% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව ලකුණු ලබා ගන්නා වැඩිම ප්‍රමාණයේ සිට පහළට එමින් පවත්නා පුරප්පාඩු අනුව අපේක්ෂකයින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. එහිදී, ක්‍රීඩා කුසලතා සඳහා ලකුණු 10ක් ලබාදෙනු ලබන අතර, පසුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට ද යොමු කෙරේ. එහිදී අපේක්ෂකයින්ට ලකුණු ලබාදීමක් සිදු නොවන අතර, විභාගයේ දී ලබාගත් ලකුණු හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු පමණක් සැළකිල්ලට ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පිළිවෙල :

කලාප මට්ටම් ක්‍රීඩා තරග ප්‍රථම ස්ථානයට ලකුණු 3 යි. දෙවැනි ස්ථානයට ලකුණු 2 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 1 යි

දිස්ත්‍රික් මට්ටමේ දී ප්‍රථම ස්ථානයට ලකුණු 4 යි. දෙවැනි ස්ථානයට ලකුණු 3 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 2යි.

ජාතික මට්ටමේ දී ප්‍රථම ස්ථානයට ලකුණු 5 යි. දෙවැනි ස්ථානයට ලකුණු 4 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 3 යි.

05 *තෝරා ගැනීමේ පදනම*.—ලිඛිත විභාගයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් අදළ බඳවා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයක් අනුමත කර ඇති පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව පත්වීම් පිරිනැමීම සඳහා තෝරාගනු ලබන අතර, පුරප්පාඩුවලින් 10% කට නොවැඩි ප්‍රමාණයක් අපේක්ෂිකාවන් සඳහා වෙන් කෙරේ.

05. (i) *ප්‍රතිඵල නිකුත් කිරීම*.-ලිඛිත පරීක්ෂණයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ගේ ලිඛිත විභාග ලකුණු හා සම්මුඛ පරීක්ෂණ ලකුණු එකතුව මත ප්‍රමුඛතාවය අනුව නිකුත් කළ ප්‍රතිඵල ලේඛනය රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් හෝ www.results.exams.gov.lk නිල වෙබ් අඩවිය හරහා හෝ ප්‍රතිඵල දැනුම් දීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ.

සටහන.—රේගු දෙපාර්තමේන්තුවේ රාජකාරි ස්වභාවය අනුව කාන්තා නිලධාරීන්ට ද සේවා මුර ක්‍රමය අනුව රාත්‍රී සේවා මුරයන්හි සේවය කිරීමට සිදුවනු ඇත.

06. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

07. ඉල්ලුම් කිරීමේ පිළිවෙල :

(i) ආදර්ශ අයදුම්පත.—මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇත. අයදුම්කරුවන් විසින් මෙකී ආදර්ශ අයදුම්පත තමා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන් ම පිළියෙල කළ යුතු අතර, එය තමන්ගේ ම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පතේ සෑම වගන්තියක්ම උපදෙස් දී ඇති පරිදිම අයදුම්කරු විසින් පිරවිය යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා "අදාළ නොවේ" යනුවෙන් සටහන් කළ යුතු ය. අයදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේම සිහි තබා ගත යුතු ය. (ආදර්ශ අයදුම්පත්‍රයේ 01 සිට 05 තෙක් ශීර්ෂ පළමු වැනි පිටුවට ද, 06 සිට 11 තෙක් ශීර්ෂ දෙවැනි පිටුවේ ද ඉතිරිය තුන්වැනි පිටුවටද, වනසේ ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන්න) ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීමේ දී විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

(ii) අයදුම්පත් 2016 මාර්තු 14 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහා එවනු ලබන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතු ය. (සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

(iii) විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13 යටතේ ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට පමණක් විභාග ගාස්තු වශයෙන් රුපියල් 500ක මුදල් ගෙවා ලබාගත් ලදුපතක් අයදුම් පත්‍රයට අමුණා එවිය යුතු ය. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබාගැනීම ඉතාම යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථා ආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අපේක්ෂකයින් තමන්ගේ අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය. 2016 මාර්තු 14 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමක් ද සමග ස්වකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට අයදුම්පත් නොඑවිය යුතුය. දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කරන අයදුම්පත් වුව ද නියමිත දිනට පසුව ලැබුනහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. "දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව තබා නොමැති නම් එම අයදුම්පත් ප්‍රතික්ෂේප වන ඇත."

(v) *සහතික කිරීම*.- දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු විසිනි. අනිකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතු ය. එනම් සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයකු, නොතාරිස් කෙනෙකු, රජයේ හෝ අධ්‍යක්‍ෂ පාලිත පාසලක විදුහල්පතිවරයෙකු, නාවික, ගුවන් හෝ යුධ හමුදාවක කොමිෂන් ලත් නිලධාරියෙකු, වාර්ෂිකව රුපියල් 240,360ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු විය යුතුය.

08. (*i*) *විභාග ප්‍රවේශ පත්‍ර*.- ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, නගරය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද, අදල නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්‍ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ පිළිබඳව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එහිදී අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම් කරුවෙකු නම් ඉහත විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක්ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වේ. එහිදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

(ii) *විභාගයට ඇතුළත් කර ගැනීම* - විභාගයට පෙනී සිටින සෑම අපේක්‍ෂයෙක්ම විභාග ප්‍රවේශ පත්‍රයේ තමාගේ අත්සන සහතික කරවා ගත යුතු අතර, නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින පළමු දිනයේම, විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ නොකරන අපේක්‍ෂකයෙකුට විභාගයට ඇතුළත් වීමට ඉඩ නොලැබෙනු ඇත. මෙම *ගැසට් පත්‍රයේ* පළමුවැනි කොටස (IIඅ) ඡේදයෙහි විභාග අපේක්‍ෂකයින් සඳහා සකස් වූ ව්‍යවස්ථා පළකොට ඇත. විභාග අපේක්‍ෂකයන් මෙම ව්‍යවස්ථා පිළිපැදීමට බැඳී සිටිති.

*සටහන.*—විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අපේක්ෂකයකු විභාග යට පෙනී සිටීම සඳහා සියළු සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

09. *අනන්‍යතාව.*—අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවත් භාරගනු ලැබේ.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
(*ආ*) මෙම විභාග දිනට අවුරුදු 05 කට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්)

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

10. *සුදුසුකම් පිළිබඳ ලියවිලි :*

(i) අයදුම්පත සමග මුදල් තැන්පත් කළ ලදුපත හැර වෙනත් කිසිදු ලිපිලේඛනයක් නොඑවිය යුතු ය. එහෙත් නියම කොට ඇති පරිදි, අවශ්‍ය සියලුම විස්තර අයදුම්පතෙහි සඳහන් කළ යුතු ය. මෙසේ අවශ්‍ය වන කරුණුවලින් සම්පූර්ණ නොවන අයදුම්පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අපේක්ෂකයින් ලියකියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාවය ඔප්පු කළ යුතු ය.

(iii) පහත දැක්වෙන ලියකියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ.

(*අ*) යහපත් චරිතය පිළිබඳ වගකිව යුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

***සටහන*** : එම සහතිකය සාමදාන විනිශ්චයකාරවරයකු, නීතිඥවරයකු, පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ වාර්ෂිකව රු. 2,40,360 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු, සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියක් දරන කෙලින්ම දන්වා තොරතුරු ලබාගත හැකි තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරෙකුගෙන් වුව ද ලබාගත හැකි වේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනය ද එය පැහැදිලි ලෙස සඳහන්ව තිබිය යුතු ය.

රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් උසුලන අපේක්ෂකයන් විසින් යහපත් චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(*ආ*) අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියාපදිංචි නොකළ අපේක්ෂකයින් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

***සටහන්*** :

(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික පත්‍ර උධෘත භාර ගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතිකය වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාර ගනු නොලැබේ. උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අපේක්ෂකයා/ අපේක්ෂිකාව සාමාන්‍යයෙන් භාවිත කරන, එසේම ඔහු/ඇය විභාගයේ දී පෙනී සිටින නම/නම් හා අතර, වෙනසක් වේ නම් උචිත පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි පරිච්ඡේදය) අංක 27 හෝ 28 දරන නියමයන් අනුව ස්වකීය උප්පැන්නයේ දැක්වෙන නම/නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතු ය.

(iii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් රජය මගින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි),

(iv) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකයක් හෝ එසේ සහතිකයක් නිකුත් කොට නැත්නම් ඊට අදාළ වූ වෙනත් රාජකාරී ලියවිලි,

(v) කලාප/දිස්ත්‍රික්/ජාතික මට්ටමේ ක්‍රීඩා තරගවල දී දැක් වූ කුසලතා සම්බන්ධ ලේඛන,

(vi) ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී අවශ්‍ය සියලුම ලියකියවිලි සූදානම් කොට තබා ගන්නා ලෙස අපේක්ෂකයන්ට අවවාද කරනු ලැබේ. ඉල්ලා සිටි විටෙක අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාද කරන අපේක්ෂකයකු වෙතොත් ඔහු මෙම තනතුරට පත් කිරීමට නුසුදුස්සකු කරනු ලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම.*- මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකුට, ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවක දී වුවද, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයෙකු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත්, හෝ එයම ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපයා නොමැති අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

13. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පලවන නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පැන නැගුනහොත් එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය බල පැවැත්වේ.

රේගු අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
රේගු මන්දිරය,
අංක : 40,
කෙළින් වීදිය,
කොළඹ 11.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම්පත්‍රය

**ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වන ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2016**

Open Competitive Examination for Recruitment to Posts of Inspector of Customs, Grade II of Sri Lanka Customs Department - 2016

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

| නගර තේරීම | නගරය | නගර අංකය |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා.- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම් වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උද : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ජාතික හැඳුනුම්පත පිළිබඳ විස්තර :

3.1 හැඳුනුම්පත් අංකය :

3.2 නිකුත් කළ දිනය :

04. ස්ත්‍රී/පුරුෂභාවය :

පුරුෂ - 0
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ :

පරම්පරාවෙන් - 1

ලියාපදිංචියෙන් - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

06. ජනවර්ගය :
සිංහල 1
ලංකා දෙමළ 2
ඉන්දියානු දෙමළ 3
මුස්ලිම් 4
බර්ගර් 5 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
වෙනත් 6

07. උපන් දිනය :

(අ) අවුරුද්ද : මාසය : දිනය :

(ආ) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : මාස : දින :

08. ශාරීරික යෝග්‍යතාවය :
(i) උස : අඩි ………… අඟල් …………

(ii) පපුව (ප්‍රසාරණය කළවිට) : අඟල් …………
(පිරිමි අයදුම්කරුවන්ට පමණයි.)

09. ඔබ කවදා හෝ උසාවියකින් වැරදිකරුවකු වී තිබේද? ඔව්/නැත
"ඔව්" නම් විස්තර සඳහන් කරන්න. :————.

10. අධ්‍යාපන සුදුසුකම් :
(i) අ. පො. ස. (උසස් පෙළ) පළමුවන වර -

විභාගයේ වර්ෂය

විභාග අංකය

| විෂයයන් | සාමාර්ථ්‍යය | විෂයයන් | සාමාර්ථ්‍යය |
|---|---|---|---|
| | | | |
| | | | |

(ii) අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| විෂයයන් | සාමාර්ථ්‍යය | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සාමාර්ථ්‍යය | සමත් වූ වර්ෂය | විභාග අංකය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

(iii) අ. පො. ස. (සා. පෙළ.) ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා ඇත්ද? ඔව්/නැත.

11. විභාග ගාස්තුව (ලදුපත අමුණා එවිය යුතු ය) :

(i) ගෙවන ලද තැපැල්/උප තැපැල් කාර්යාලය :————.

(ii) ගෙවූ මුදල :————. (iii) ගෙවූ දිනය :————.

(iv) ලදුපතේ අංකය :————.

| |
|---|
| ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.) |

(මෙහි සඳහන් විස්තර අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතු ය)

12. අයදුම්කරුගේ ප්‍රකාශය/සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සඳහන් කර තිබෙන සියලු විස්තර සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව, ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (අදාළ නොවන වචන කපා හරින්න)

මෙම අයැදුම්පත ඉදිරිපත් කරන ..................................... නැමැති මහතා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත් ඔහු/ඇය ............ මස ............ වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, *නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්* මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන :————.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

දිනය :————.

සටහන : අයදුම්පත සහතික කළ යුත්තේ *ගැසට් නිවේදනයේ* 7 (v) ඡේදයේ සඳහන් පරිදි ය.

14. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම අයැදුම්පත ඉදිරිපත් කරන ..................................... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයකු වන අතර, ඔහු/ඇය ඉහත තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි ය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව).

දිනය :————.
ආයතන ප්‍රධානියාගේ නම :————.
තනතුර :————.
සේවා ස්ථානයේ ලිපිනය :————.

02-307

---

## නවක සිසුන් බඳවා ගැනීම - 2016
## හේමාල්ස් වෘත්තීය පුහුණු ආයතනය
## 342 නුවර පාර - කැලණිය

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) ලියාපදිංචි ඉහත වෘත්තීය පුහුණු ආයතනයට 2016 වසරට නවක සිසුන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

අවශ්‍ය සුදුසුකම් :

1. වයස අවුරුදු 16ට වැඩි තරුණ තරුණියන් වීම.
2. පාසැල් අධ්‍යාපනය අවසන් කර තිබීම.
3. අවම වශයෙන් අටවැනි ශ්‍රේණිය හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම්.

පාඨමාලා :

1. විදුලි මෝටර් එතීම. (මාස 06යි)
2. පැස්සුම් ශිල්පය (අවුරුදු 01යි)
3. යාන්ත්‍රික ශිල්පය (අවුරුදු 01යි)

පාඨමාලා කාලය තුළ ඔබට ලැබෙන විශේෂ අවස්ථා :

(i) වෘත්තීය මාර්ගෝපදේශනය
(ii) නායකත්වය හා පෞරුෂ සංවර්ධනය
(iii) ආකල්ප සංවර්ධනය

පුහුණුවෙන් පසු :

1. ලොවම පිළිගත් සහතිකයක්.
2. ආයතනයේම වැඩිදුර පුහුණුව
3. අනිවාර්යය දෙස් විදෙස් රැකියා අවස්ථා

මෙම පාඨමාලා සඳහා ඔබ විසින් ම සකසාගත් ඔබේ නම, ලිපිනය, හැඳුනුම්පත් අංකය, අයදුම් කරන පාඨමාලාව හා දුරකථන අංකය ද සඳහන් කළ අයදුම්පතක් 2016 මාර්තු මස 10 වැනි දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන්නට සලස්වන්න.

පාඨමාලා අධ්‍යක්ෂ,
හේමාල්ස් වෘත්තීය පුහුණු ආයතනය,
අංක 342, නුවර පාර, 4 කණුව,
කැලණිය.

කේ. මිල්ටන්,
පාඨමාලා අධ්‍යක්ෂ.

2016 ජනවාරි මස 27 වැනි දින

02-367

## ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

### ග්‍රාම නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2016

දිවයින පුරා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පුරප්පාඩුව පවතින ග්‍රාම නිලධාරි කොට්ඨාසවලට ග්‍රාම නිලධාරින් පත් කිරීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. අයදුම්කරුවෙකුට පහත 06 වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව සුදුසුකම් ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවත්නා පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ හැකිය.

3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා අයත් දිස්ත්‍රික්ක පිළිබඳ තොරතුරු I වැනි උපලේඛනයේ දක්වේ අයදුම්කරුවන් තමා ඉල්ලුම් කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා එහි අංකයත්, දිස්ත්‍රික්කයේ නම හා අංකයත් එම උපලබනයේ සඳහන් පරිදි නිවැරදිව අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතුය. එය පසු අවස්ථාවක වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එම විස්තර වැරදි ලෙස සටහන් කිරීම හේතුවෙන් අයදුම්කරුවකුට සිදුවන කිසියම් අවාසියක් සම්බන්ධ කිසිදු ඉල්ලීමක් සලකා නොබලන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා කොට්ඨාස අංකය සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. *තරග විභාගය පිළිබඳ විස්තර* :

4.1 විභාග මාධ්‍යය - මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් 1 වැනි උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික්ක තුළදී පවත්වනු ඇත. එහෙත් විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති දිස්ත්‍රික්කවල අයදුම්කරුවන් ආසන්න වෙනත් දිස්ත්‍රික්කයක විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. අපේක්ෂකයින් එක් භාෂා මාධ්‍යකින් පමණක් පෙනී සිටිය යුතුය. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ.

4.2 ග්‍රාම නිලධාරින් බඳවා ගැනීමේ විභාගය, පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| *විෂයය අංකය* | *විෂයය* | *කාලය* | *ලකුණු* |
|---|---|---|---|
| 01 | භාෂා හැකියාව | පැය 1 1/2 යි | 100 |
| 02 | සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාව | පැය 1 1/2 යි | 100 |

4.3 විෂය නිර්දේශය :

4.3.1 භාෂා හැකියාව : මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.

4.3.2 සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාව : මෙම ප්‍රශ්න පත්‍රය මගින් දේශීය හා විදේශීය වශයෙන් වැදගත්වන ඓතිහාසික, භූගෝලීය, සමාජයීය හා ආර්ථික තොරතුරු හා දේශීය හා විදේශීය කාලීන තොරතුරු පිළිබඳ සාමාන්‍ය දැනීම සහ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, ගැටලු නිරාකරණය, තීරණ ගැනීමේ හැකියාව ඇතුළු සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.

4.4 ලිඛිත පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබාගැනීමේ අනුපිළිවෙල අනුව අයදුම්කරුවන් ප්‍රමුඛතාගත කිරීමේ දී එක් එක් විෂයයන්ට 40% හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ඇති අයදුම්කරුවන් පමණක් සැලකිල්ලට ගනු ලැබේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

(i) ලිඛිත විභාගයෙන් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වැඩිම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. ලිඛිත විභාගයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල එකතුවෙන් වැඩිම ලකුණු ලබා සුදුසුකම් ලබන අයදුම්කරුවන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා පුහුණු පාඨමාලාවකට තෝරා ගනු ලැබේ.

(ii) ඉහත 5(i) ඡේදයේ සඳහන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ආකාරයට ලකුණු ලබාදෙනු ඇත.

(අ)

| *ලකුණු දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| නායකත්වය | 20 |
| ක්‍රීඩා කුසලතා | 10 |
| භාෂා ප්‍රවීණතාවය (මව් භාෂාව හැර අනෙක් භාෂා ප්‍රවීණතාවන්ට) | 10 |
| පරිගණක දැනුම | 05 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතා | 05 |
| එකතුව | 50 |

(ආ) ලකුණු ලබාදීමේදී සලකා බලනු ලබන්නේ රාජ්‍ය ආයතනයකින්/දෙපාර්තමේන්තුවකින් විධිමත්ව නිකුත් කරන ලද සහතික සහ අදාළ කරුණු සනාථ කිරීම සම්බන්ධයෙන් වගකීම පැවරෙන රජයේ දෙපාර්තමේන්තු, ආයතනවල මාණ්ඩලික මට්ටමේ නිලධාරින් නිකුත් කරන ලද සනාථ කිරීමේ ලිපි පමණි. උදහරණ වශයෙන් දහම් පාසල් ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීම, ග්‍රාම සංවර්ධන සමිතියක නිලතල දැරීම, ක්‍රීඩා සමාජයක නිලතල දැරීම වැනි කරුණු ප්‍රාදේශීය ලේකම් විසින් සනාථ කළ යුතුය.

(ඇ) ග්‍රාම නිලධාරින්ට දේශපාලන අයිතිවාසිකම් නොමැති බැවින් දේශපාලන මට්ටමේ සංවිධානවල නිලතල දැරීම සම්බන්ධයෙන් ලකුණු ලබාදෙනු නොලැබේ. උදහරණ වශයෙන් ප්‍රාදේශීය සභා/නගර සභා මන්ත්‍රීවරුන්, සමුපකාර සමිති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වැනි දේශපාලන පක්ෂ නියෝජනයෙන් ලබා ගන්නා තනතුරු දක්විය හැකිය.

(iii) මාස තුනක් වන පුහුණු පාඨමාලාව දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ පවත්වන අතර එම පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කරන ලද බවට දිස්ත්‍රික් ලේකම් විසින් නිර්දේශ කරන අය මවිසින් ග්‍රාම නිලධාරි III වන ශ්‍රේණියට

පත් කරනු ලැබේ. පුහුණු කාලය සඳහා රු. 3,000.00 ක දීමනාවක් පමණක් ගෙවනු ලබන අතර එම කාලය තුළ නිවාඩු හිමිකම් නොමැත. පාඨමාලාව පැවැත්වෙන දින ගණනින් 80% අවම වශයෙන් සහභාගි විය යුතුය. පුහුණු වැඩසටහන යටතේ පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයෙන් සමත්වීම සඳහා 50% ක් ලකුණු ලබාගත යුතු ය. පුහුණු කාලය සේවා කාලයට ගණනය කරනු නොලබන අතර එම කාලය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව විශ්‍රාම වැටුප් ගණනය සඳහා පමණක් අදාළ කරගනු ඇත.

(iv) පුරප්පාඩුවක් හෝ පුරප්පාඩු කිහිපයක් සඳහා සමාන ලකුණු ලබා ඇති අයදුම්කරුවන් එක් අයෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් ඇති අවස්ථාවක එම පුරප්පාඩුව හෝ පුරප්පාඩු කිහිපය හෝ පිරවීම පිළිබඳ මවිසින් තීරණය කරනු ලැබේ.

6. *අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම්* : අපේක්ෂකයින් අවම වශයෙන් පහත දක්වෙන සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

6.1 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වර්ෂ හයක (06) කාල සීමාවක් ඇතුළත අපේක්ෂකයා තමා තනතුරට පත්වීමට බලාපොරොත්තුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අවම වශයෙන් වසර තුනක් (03) අඛණ්ඩව ස්ථිරව පදිංචිව සිටිය යුතු අතර එය-

1. ඡන්දහිමි නාමලේඛනයේ උධෘත හෝ;
2. ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකයක් මඟින් සනාථ කළ යුතුය.

6.2 වයස් සීමාව - අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු සහ 35ට නොවැඩි අයකු විය යුතුය.

6.3 අධ්‍යාපන සුදුසුකම් - අයදුම්කරුවන්ට පහත සඳහන් පරිදි අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය.

(*අ*) පළමු භාෂාව ලෙස සිංහල හෝ දෙමළ භාෂා අතරින් එක් භාෂා විෂයයක් හා ගණිතය ඇතුලුව අවම වශයෙන් විෂයයන් හතරකට (04) සම්මාන හතරක් සමඟ විෂයයන් හයකින් (06) එක වරකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම,

*සහ*

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය හැර) එකවර සමත්වීම, පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත්වීම ප්‍රමාණවත් වේ.

6.4 අපේක්ෂකයින් —

1. උපතින් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතු ය.
2. සාපරාධී ක්‍රියාවන් සම්බන්ධව අධිකරණයේ වරදකරුවකු කරනු ලැබූවකු නොවිය යුතු අතර ඉතා හොඳ චරිතයකින් යුත් අයකු විය යුතු ය.
3. රජයේ හෝ රජයේ සංස්ථාවක හෝ රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක සේවයෙන් පහකළ අයකු, සේවය හැරගිය අයකු හෝ අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගැන් වූ අයකු හෝ නොවිය යුතු ය.
4. වස්තු භංගත්වයට පත්වී ඇති තැනැත්තෙකු නොවිය යුතු ය.
5. යම් ආගමක හෝ ආගමික නිකායක පැවිදිවරයක් දරන තැනැත්තෙකු නොවිය යුතු ය.

07. *තනතුරට අදාළ මාසික වැටුප් ක්‍රමය* :-

වැටුප් පරිමාණය - රු. 13,990-10x145-11x170-6x240-14x320-රු. 23,230

08. *සේවා කොන්දේසි* :

8.1 බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ ග්‍රාම නිලධාරි සේවයේ III වැනි ශ්‍රේණියට ය.

8.2 තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත වේ. වැන්දඹු අනත්දරු/පුරුෂ අරමුදල සඳහා දායක විය යුතුය. මාස 03ක පුහුණු කාලය ග්‍රාම නිලධාරි සේවා කාලයට ගණන් ගනු නොලැබේ.

8.3 මුල් පත්වීම් දින සිට වසර තුනක් පත්කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ අනිවාර්යයෙන් සේවය කළ යුතුය.

8.4 සතියට එක් විවේක දිනයක් හිමි අතර එම දිනය හැර සතියේ අනෙක් දිනයන්හි පැය 24 තුළ රාජකාරි සඳහා පත් කරනු ලබන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ රාජකාරි ඉටු කිරීම සඳහා බැඳී සිටියි.

8.5 මෙම තනතුර සඳහා පත්වන අයකු අනුමත බඳවා ගැනීම් පටිපාටියේ, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය සංග්‍රහයේ, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන රෙගුලාසිවලටද රජය විසින් පනවන ලද හා ඉදිරියේදී පනවනු ලබන රෙගුලාසි හා විධිවිධානවලටද යටත් වේ.

09. *අයදුම්පත් එවිය යුතු ආකාරය* :

9.1 ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම් පත්‍ර 2016.03.14 දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ, යන ලිපිනයට ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලු කවරයේ වම් ඉහළ කෙළවර "ග්‍රාම නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය 2016" යනුවෙන් සඳහන් කළ යුතුය.

9.2 අයදුම්පත්‍රය, ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ-4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් ශීර්ෂ අංක 08 දක්වා මුල් පිටුවේද ඉතිරිය අනෙක් පිටුවලටද ඇතුළත් වන පරිදි මුද්‍රණය කර හෝ යතුරු ලියනය කර අපේක්ෂකයාගේ අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

9.3 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රු. 240, 360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

9.4 දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවිය යුතුය.

9.5 විභාග ගාස්තු වශයෙන් රු. 500 ක මුදලක් අයකරනු ලැබේ. අයදුම්කරුගේ නමින් මෙම විභාගයට අදාළව පමණක් එම මුදල ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට, විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13ට බැර කර ලබා ගන්නා ලද කුවිතාන්සිය විභාග අයැදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය. (කුවිතාන්සි අංකය, දිනය හා තැපැල් කාර්යාලය පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.) ගෙවන ලද විභාග ගාස්තු මොනයම් හේතුවක් නිසාවත් ආපසු නොගෙවනු ලබන අතර, මෙම විභාග ගාස්තු කිසියම් විභාග යකට මාරු කිරීමටද සලකා බලනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9.6 අසම්පූර්ණ හා අවිධිමත් අයදුම්පත්‍ර කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. උදාහරණ වශයෙන් 9.2 ඡේදයේ සඳහන් ආකාරයට අනුකූලව අයදුම්පත්‍රය සකස් කිරීම, කියවීමට අපහසු ආකාරයට අපැහැදිලි ලෙස අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම පත්වීම අපේක්‍ෂා කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා අංකය නිවැරදිව ඇතුළත් නොකිරීම, අයදුම්කරු අත්සන් කර නොතිබීම, විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය අලවා නොතිබීම ආදී කරුණු දැක්විය හැකිය.

10. *විභාගයට පෙනී සිටීම හා ප්‍රතිඵල නිකුත් කිරීම* :

10.1 විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විභාග මධ්‍යස්ථානයේ දී තම අනන්‍යතාව ඔප්පු කළ යුතු අතර, ඒ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගැනේ.

10.2 අපේක්‍ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්‍ෂකයකුම විභාග දිනයේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්‍ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10.3 *ප්‍රතිඵල නිකුත් කිරීම*
*ගැසට්* නිවේදනයේ 4.4 ඡේදයට අනුව ලිඛිත පරීක්‍ෂණයෙන් සුදුසුකම් ලැබුවන්ගේ නාම ලේඛන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව වෙන් වෙන් වශයෙන් ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. සම්මුඛ පරීක්‍ෂණයේ ලකුණු ලැබීමෙන් අනතුරුව ලිඛිත හා සම්මුඛ පරීක්‍ෂණ ලකුණුවල මුළු ලකුණු ප්‍රමුඛතාවය මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් සකස් කළ ප්‍රතිඵල ලේඛන ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ දැනුම්දීම අනුව සිදුකරනු ඇත.

11. සියලුම විභාග අපේක්‍ෂකයින් රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන විභාග නීතිරීති පිළිබඳ අවබෝධයක් ලබා සිටිය යුතු අතර, ඒවා පිළිපැදීමට බැඳී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්‍ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට අපේක්‍ෂකයින්ට සිදු වේ.

12. අපේක්‍ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකෙන අතර අයදුම්පත්‍රය වැරදි සහගතව හා අසම්පූර්ණව ඉදිරිපත් කර යම්කිසි අවාසියක් වෙතොත් අපේක්‍ෂකයා විසින්ම එය විඳ දරාගත යුතුය. එවැනි කරුණු සම්බන්ධව කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

13. බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ කිනම් දිනකට අදාළව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත ද යන්න මවිසින් තීරණය කරනු ලබන අතර, එසේ තීරණය කරනු ලබන දිනය වන විට වාර්ෂික ස්ථාන මාරු කිරීම් හේතුවෙන් I වැනි උපලේඛනයේ සඳහන් සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පුරප්පාඩු සම්පූර්ණ වී තිබීමට ඉඩ ඇති බව අපේක්‍ෂකයින්ගේ අවධානයට ලක් කරනු ලැබේ. එවැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් ඉදිරිපත් වන අපේක්‍ෂකයින් වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක පවතින පුරප්පාඩු සඳහා සුදුසුකම් ලැබීමට හිමිකම් නොලබන බව ද අවධාරණය කරනු ලැබේ.

14. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාල ලදුපත සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම හා අංකය, දිස්ත්‍රික්කයේ නම හා අංකය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීමද අදාල නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලබන අතර, මූලික සුදුසුකම් නොමැති බව සම්මුඛ පරීක්‍ෂණයේදී හෝ පසු අවස්ථාවකදී හෝ අනාවරණය වුවහොත් විභාගයේ ප්‍රතිඵල මෙම තනතුර ලබ ගැනීම සඳහා සුදුසුකමක් ලෙස සලකනු නොලැබේ. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පලකරනු ඇත. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින 05කටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්‍ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබාගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

15. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

16. මෙම නිවේදනය මගින් අනාවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2015 ජනවාරි මස 28 වැනි දින,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

ග්‍රාම නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2016
Competitive Examination for Recruitment to Grade III of Grama Niladhari - 2016

01. පත්වීම සඳහා අයදුම් කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම හා අංකය

නම :........................ අංකය :

(උපලේඛන 1 හි සඳහන් පරිදි අදාළ වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නම හා අංකය නිවැරදිව සඳහන් කළ යුතුය. එය පසු අවස්ථාවකදී වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

02. පත්වීම සඳහා අයදුම් කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අයත් දිස්ත්‍රික්කයේ නම හා අංකය

නම :........................ අංකය :

03. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3 භාෂා මාධ්‍යය :........................ අංකය :
ඉංග්‍රීසි - 4
(අදාළ භාෂා මාධ්‍යය හා අංකය කොටු තුළ ලියන්න. මෙය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

04. 4.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

4.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසවු ද යොද නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා :- Gunawardhana, H. M. S. K.)

4.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

05. 5.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

5.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

06. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 (අදාළ කොටුව තුළ අංකය ලියන්න.)
ස්ත්‍රී - 1

07. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියකු වන්නේ :
පරම්පරාවෙන් - 1 (අදාළ කොටුව තුළ අංකය ලියන්න)
ලියාපදිංචි වීමෙන් - 2

08. 8.1 ජාතික හැඳුනුම්පත් අංකය :

8.2 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

8.3 2016.03.14 දිනට වයස : අවුරුදු : මාස : දින :

09. ස්ථිර පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාශය හා අංකය :

10. අධ්‍යාපන සුදුසුකම් ඃ
10.1 අ. පො. ස. (සා.පෙ.)/සුදුසුකම් ලැබූ විභාගයේ විස්තර

විභාගයේ නම :————.

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |

10.2 අ. පො. ස. (උ.පෙ.) සුදුසුකම් ලැබූ විභාගයේ විස්තර ඃ

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

11. වෙනත් සුදුසුකම් :————.

12. ඔබට විරුද්ධව මීට පෙර කවර හෝ චෝදනාවක් සම්බන්ධව අධිකරණය ඉදිරියේ නඩු පැවරීමක් හෝ උසාවියකින් වරදකරු වී ඇති අයෙක් ද යන වග - ඔව්/නැත
ඔව් නම (i) උසාවිය හා නඩු අංකය :————.
(ii) චෝදනාව :————.
(iii) අධිකරණ තීන්දුව/දඬුවම :————.

13. ඔබ මීට පෙර රජයේ හෝ පළාත් සභාවක හෝ සංස්ථාවක හෝ අධිකාරියක හෝ රජයට අනුබද්ධ ආයතනයක හෝ සේවය කර විනය හේතුවක් මත සේවයෙන් පහකර ඇත්තාවූ හෝ අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගැන්වූ හෝ සේවය හැර ගියාවූ තැනැත්තෙක් ද යන වග - ඔව්/නැත (ඔව් නම් විස්තර සඳහන් කරන්න.) :————.

14. අයදුම්කරුගේ සහතිකය ඃ

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිම.
(ආ) මෙම අයදුම්පත හැරුණු විට මෙම විභාගය සඳහා මෙම *ගැසට්* නිවේදනය අනුව වෙනත් අයදුම්පතක් මා විසින් ඉදිරිපත් කර නොමැති බව අවංකව ප්‍රකාශ කර සිටිමි.
(ඇ) විභාග ගාස්තු වශයෙන් රුපියල් .........ක් ගෙවන ලදී. ලදුපත් අංකය :————.
ගෙවූ තැපැල් කාර්යාලය :————.

දිනය :————.

(ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.)

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන තීරණවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

(ඉ) මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු හා කරනු ලැබ ඇති ප්‍රකාශය මා සේවයට බඳවා ගැනීමට පෙර අසත්‍ය බැව් ඔප්පු වුවහොත් මෙම තනතුරට නුසුදුස්සකු වන බව හා එම තනතුරට පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවය අවසන් කිරීමට හෝ සේවයෙන් පහ කරනු ලැබීමට හෝ යටත්වන බව මම දන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය 201/ / දින මා ඉදිරිපිට දී මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ බව ද මෙයින් සහතික කරමි.

—————.
සහතික කරන්නාගේ අත්සන.

නම :—————.

පදවි නාමය :—————.

දිනය :—————.

(නිල මුද්‍රාව යොදන්න.)

16. දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත සඳහා ඃ

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................. මයා/මිය/මෙනවිය අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ......... දින සිට ......... තනතුරෙහි සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත්, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් සහතික කරමි. තවද ඔහු/ඇය මෙම තනතුරට තෝරා ගතහොත් වත්මන් තනතුරේ සේවයෙන් නිදහස් කළ හැකි /නොහැකි බවත් ප්‍රකාශ කර සිටිමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

දිනය :—————.

උපලේඛනය I

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* |
|---|---|---|
| කොළඹ | 1103 | |
| කොලොන්නාව | 1106 | |
| කඩුවෙල | 1109 | |
| හෝමාගම | 1112 | |
| හංවැල්ල | 1115 | |
| පාදුක්ක | 1118 | |
| මහරගම | 1121 | |
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | 1124 | |
| තිඹිරිගස්යාය | 1127 | කොළඹ |
| දෙහිවල | 1130 | |
| රත්මලාන | 1131 | |
| මොරටුව | 1133 | 01 |
| කැස්බෑව | 1136 | |
| මීගමුව | 1203 | |
| කටාන | 1206 | |
| දිවුලපිටිය | 1209 | |
| මීරිගම | 1212 | |
| මිනුවන්ගොඩ | 1215 | |
| වත්තල | 1218 | |
| ජාඇල | 1221 | |
| ගම්පහ | 1224 | ගම්පහ |
| අත්තනගල්ල | 1227 | |
| දොම්පේ | 1230 | 02 |
| මහර | 1233 | |
| කැළණිය | 1236 | |
| බියගම | 1239 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| පානදුර | 1303 | |
| බණ්ඩාරගම | 1306 | |
| හොරණ | 1309 | |
| ඉංගිරිය | 1310 | |
| බුලත්සිංහල | 1312 | |
| මදුරාවල | 1315 | කළුතර |
| මිල්ලනිය | 1318 | |
| කළුතර | 1321 | |
| බේරුවල | 1324 | 03 |
| දොඩන්ගොඩ | 1327 | |
| මතුගම | 1330 | |
| අගලවත්ත | 1333 | |
| පාලින්දනුවර | 1336 | |
| වලල්ලාවිට | 1339 | |
| තුම්පනේ | 2103 | |
| පූජාපිටිය | 2106 | |
| අකුරණ | 2109 | |
| පාතදුම්බර | 2112 | |
| පන්විල | 2115 | |
| උඩුදුම්බර | 2118 | |
| මිනිපේ | 2121 | |
| මැදදුම්බර | 2124 | |
| කුණ්ඩසාලේ | 2127 | මහනුවර |
| ගඟවට කෝරළේ | 2130 | |
| හාරිස්පත්තුව | 2133 | 04 |
| හතරලියද්ද | 2134 | |
| යටිනුවර | 2136 | |
| උඩුනුවර | 2139 | |
| දොළුව | 2142 | |
| පාතහේවාහැට | 2145 | |
| දෙල්තොට | 2148 | |
| උඩපළාත | 2151 | |
| ගඟඉහලකෝරළේ | 2154 | |
| පස්බාගේ කෝරළේ | 2157 | |
| ගලේවෙල | 2203 | |
| දඹුල්ල | 2233 | |
| නාඋල | 2209 | |
| පල්ලෙපොල | 2212 | මාතලේ |
| යටවත්ත | 2215 | |
| මාතලේ | 2218 | 05 |
| අඹන්ගඟ කෝරළේ | 2221 | |
| ලග්ගල පල්ලේගම | 2224 | |
| විල්ගමුව | 2227 | |
| රත්තොට | 2230 | |
| උකුවෙල | 2233 | |
| කොත්මලේ | 2303 | |
| හඟුරන්කෙත | 2306 | |
| වලපනේ | 2309 | නුවරඑළිය |
| නුවරඑළිය | 2312 | |
| අඹගමුව | 2315 | 06 |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| බෙන්තොට | 3103 | |
| බලපිටිය | 3106 | |
| කරන්දෙනිය | 3109 | |
| ඇල්පිටිය | 3112 | |
| නියාගම | 3115 | |
| තවලම | 3118 | |
| නෙළුව | 3121 | |
| නාගොඩ | 3124 | |
| බද්දේගම | 3127 | ගාල්ල |
| වැලිවිටිය දිවිතුර | 3130 | |
| අම්බලන්ගොඩ | 3133 | 07 |
| හික්කඩුව | 3136 | |
| කඩවත්සතර | 3139 | |
| බෝපෙ පෝද්දල | 3142 | |
| අක්මීමන | 3145 | |
| යක්කලමුල්ල | 3148 | |
| ඉමදූව | 3151 | |
| ගෝනපීනුවල | 3154 | |
| හබරාදූව | 3157 | |
| පිටබැද්දර | 3203 | |
| කොටපොල | 3206 | |
| පස්ගොඩ | 3209 | |
| මුලටියන | 3212 | |
| අතුරලිය | 3215 | මාතර |
| අකුරැස්ස | 3218 | |
| වැලිපිටිය | 3221 | |
| මාලිම්බඩ | 3224 | 08 |
| කඹුරුපිටිය | 3227 | |
| හක්මන | 3230 | |
| කිරින්ද පුහුලුවැල්ල | 3233 | |
| තිහගොඩ | 3236 | |
| වැලිගම | 3239 | |
| මාතර | 3242 | |
| දෙවිනුවර | 3245 | |
| දික්වැල්ල | 3248 | |
| සූරියවැව | 3303 | |
| ලුණුගම්වෙහෙර | 3306 | |
| තිස්සමහාරාමය | 3309 | |
| හම්බන්තොට | 3312 | |
| අම්බලන්තොට | 3315 | හම්බන්තොට |
| අඟුණකොලපැලැස්ස | 3318 | |
| වීරකැටිය | 3321 | 09 |
| කටුවන | 3324 | |
| ඕකේවෙල | 3327 | |
| බෙලිඅත්ත | 3330 | |
| තංගල්ල | 3333 | |
| වලස්මුල්ල | 3336 | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* |
|---|---|---|
| කයිට්ස් | 4103 | |
| වානක්කනි | 4106 | |
| සන්දිලිපායි | 4109 | |
| තෙලිප්පායි | 4112 | |
| උඩුවිල් | 4115 | |
| කෝපායි | 4118 | යාපනය |
| කරවෙඩ්ඩි | 4121 | |
| මුරුතන්කර්නි | 4124 | |
| පොයින්ට් පේද්‍රු | 4127 | 10 |
| චාවාකච්චේරි | 4130 | |
| නල්ලූර් | 4133 | |
| යාපනය | 4136 | |
| වෙලනායි | 4139 | |
| ඩෙල්ෆ් | 4142 | |
| කරෙයිනගර් | 4145 | |
| මන්නාරම | 4203 | |
| මාන්තායි බටහිර | 4206 | මන්නාරම |
| මඩු | 4209 | |
| නානද්දන් | 4212 | 11 |
| මුසාලි | 4215 | |
| වවුනියා උතුර | 4303 | |
| වවුනියා දකුණ | 4306 | වවුනියා |
| වවුනියා | 4309 | |
| වෙන්ගලචේඩිකුලම් | 4312 | 12 |
| තුනුක්කායි | 4403 | |
| මාන්තායි නැගෙනහිර | 4406 | |
| පුදුකුඩිඉරුප්පු | 4409 | මුලතිව් |
| ඔඩ්ඩුසුඩාන් | 4412 | |
| මැරිටයිම්පත්තු | 4415 | 13 |
| වැලිඔය | 4418 | |
| පච්චිලෙයිපල්ලි | 4503 | කිලිනොච්චිය |
| කඳවලෙයි | 4506 | |
| කරච්චි | 4509 | 14 |
| පූනාකරි | 4512 | |
| කෝරළේපත්තු උතුර | 5103 | |
| කෝරළේපත්තු බටහිර | 5106 | |
| කෝරළේපත්තු | 5109 | |
| එරාවුර්පත්තු | 5112 | |
| එරාවුර් නගරය | 5115 | මඩකලපුව |
| මන්මුනේ උතුර | 5118 | |
| මන්මුනේ බටහිර | 5121 | |
| කාත්තන්කුඩි | 5124 | 15 |
| මන්මුනේපත්තු | 5127 | |
| මන්මුනේ නිරිත | 5130 | |
| පෝර්තිව්පත්තු | 5133 | |
| මන්මුනේ දකුණ | 5136 | |
| කෝරළේපත්තු දකුණ | 5139 | |
| කෝරළේපත්තු මධ්‍යම | 5142 | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* |
|---|---|---|
| දෙහිඅත්තකණ්ඩිය | 5209 | |
| පදියතලාව | 5206 | |
| මහඔය | 5209 | |
| උහන | 5212 | අම්පාර |
| අම්පාර | 5215 | |
| නාවින්දවේලි | 5216 | |
| සමන්තුරෙයි | 5218 | 16 |
| කල්මුණේ දමිල | 5224 | |
| සයින්ද මුරුදු | 5225 | |
| කාර්තිවු | 5227 | |
| නින්දවුර් | 5230 | |
| අඩ්ඩාලච්චේන | 5233 | |
| ඉරක්කාමම් | 5234 | |
| අක්කරපත්තුව | 5236 | |
| අලයඩිවෙම්බු | 5239 | |
| දමන | 5242 | |
| තිරුක්කෝවිල් | 5245 | |
| පොතුවිල් | 5248 | |
| ලාහුගල | 5251 | |
| කල්මුණේ මුස්ලිම් | 5254 | |
| පදවි ශ්‍රී පුර | 5303 | |
| කුච්චවේලි | 5306 | |
| ගෝමරන්කඩවල | 5309 | |
| මොරවැව | 5312 | ත්‍රිකුණාමලය |
| නගර හා කඩවත් | 5315 | |
| තඹලගමුව | 5318 | |
| කන්තලේ | 5321 | 17 |
| කින්නියා | 5324 | |
| මුතූර් | 5327 | |
| සේරුවිල | 5330 | |
| වෙරුගල්/ඉච්චලම්පත්තු | 5333 | |
| ගිරිබාව | 6103 | |
| ගල්ගමුව | 6106 | |
| ඇහැටුවැව | 6109 | |
| අඹන්පොල | 6112 | |
| කොටවෙහෙර | 6115 | |
| රස්නායකපුර | 6118 | |
| නිකවැරටිය | 6121 | |
| මහව | 6124 | |
| පොල්පිතිගම | 6127 | |
| ඉබ්බාගමුව | 6130 | |
| ගනේවත්ත | 6133 | කුරුණෑගල |
| වාරියපොල | 6136 | |
| කොබෙයිගනේ | 6139 | |
| බිංගිරිය | 6142 | 18 |
| බමුණාකොටුව | 6149 | |
| මාස්පොත | 6151 | |
| කුරුණෑගල | 6154 | |
| මල්ලවපිටිය | 6157 | |
| මාවතගම | 6160 | |
| රිදීගම | 6163 | |
| වීරඹුගෙදර | 6166 | |
| කුලියාපිටිය නැගෙනහිර | 6169 | |
| කුලියාපිටිය බටහිර | 6172 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| උඩුබද්දාව | 6175 | |
| පන්නල | 6178 | |
| නාරම්මල | 6181 | |
| අලව්ව | 6184 | |
| පොල්ගහවෙල | 6187 | |
| පඬුවස්නුවර නැගෙනහිර | 6190 | |
| පඬුවස්නුවර බටහිර | 6193 | |
| කල්පිටිය | 6203 | |
| වනාතවිල්ලුව | 6206 | |
| කරුවලගස්වැව | 6209 | |
| නවගත්තේගම | 6212 | |
| පුත්තලම | 6215 | |
| මුන්දලම | 6218 | පුත්තලම 19 |
| මහකුඹුක්කඩවල | 6221 | |
| ආණමඩුව | 6224 | |
| පල්ලම | 6227 | |
| ආරච්චිකට්ටුව | 6230 | |
| හලාවත | 6233 | |
| මාදම්පෙ | 6236 | |
| මහවැව | 6239 | |
| නාත්තන්ඩිය | 6242 | |
| වෙන්නප්පුව | 6245 | |
| දංකොටුව | 6248 | |
| පදවිය | 7103 | |
| කැබිතිගොල්ලෑව | 7106 | |
| මැදවච්චිය | 7109 | |
| මහවිලච්චිය | 7112 | |
| මධ්‍යම නුවරගම්පලාත | 7115 | |
| රඹෑව | 7118 | |
| කහටගස්දිගිලිය | 7121 | |
| හොරොව්පතාන | 7124 | |
| ගලෙන්බිඳුනුවැව | 7127 | |
| මිහින්තලේ | 7130 | |
| නැගෙනහිර නුවරගම්පළාත | 7133 | |
| නච්චදූව | 7136 | අනුරාධපුරය 20 |
| නොච්චියාගම | 7139 | |
| රාජාංගනය | 7142 | |
| තඹුත්තේගම | 7145 | |
| තලාව | 7148 | |
| තිරප්පනේ | 7151 | |
| කැකිරාව | 7154 | |
| පළුගස්වැව | 7157 | |
| ඉපලෝගම | 7160 | |
| ගල්නෑව | 7163 | |
| පලාගල | 7166 | |
| හිඟුරක්ගොඩ | 7203 | |
| මැගිරිගිරිය | 7206 | |
| ලංකාපුර | 7209 | |
| වැලිකන්ද | 7210 | පොළොන්නරුව 21 |
| දිඹුලාගල | 7212 | |
| තමන්කඩුව | 7215 | |
| ඇලහැර | 7218 | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* |
|---|---|---|
| මහියංගනය | 8103 | |
| රිදීමාලියද්ද | 8106 | |
| මීගහකිවුල | 8109 | |
| කන්දෙකැටිය | 8112 | |
| සොරණාතොට | 8115 | බදුල්ල |
| පස්සර | 8118 | |
| ලුණුගල | 8119 | |
| බදුල්ල | 8121 | 22 |
| හාලිඇල | 8124 | |
| ඌව පරණගම | 8127 | |
| වැලිමඩ | 8130 | |
| බණ්ඩාරවෙල | 8133 | |
| ඇල්ල | 8136 | |
| හපුතලේ | 8139 | |
| හල්දුම්මල | 8142 | |
| බිබිල | 8203 | |
| මඩුල්ල | 8206 | |
| මැදගම | 8209 | |
| සියඹලාන්ගමුව | 8212 | |
| මොණරාගල | 8215 | |
| බඩල්කුඹුර | 8218 | මොනරාගල |
| බුත්තල | 8221 | |
| වැල්ලවාය | 8224 | 23 |
| කතරගම | 8227 | |
| තණමල්විල | 8230 | |
| සෙවනගල | 8233 | |
| ඇහැලියගොඩ | 9103 | |
| කුරුවිට | 9106 | |
| කිරිඇල්ල | 9109 | |
| රත්නපුර | 9112 | |
| ඉඹුල්පෙ | 9115 | |
| බලංගොඩ | 9118 | |
| ඕපනායක | 9121 | රත්නපුර |
| පැල්මඩුල්ල | 9124 | |
| ඇලපාත | 9127 | |
| අයගම | 9130 | 24 |
| කලවාන | 9133 | |
| නිවිතිගල | 9136 | |
| කහවත්ත | 9139 | |
| ගොඩකවෙල | 9142 | |
| වැලිගෙපොල | 9145 | |
| ඇඹිලිපිටිය | 9148 | |
| කොලොන්න | 9151 | |
| රඹුක්කන | 9203 | |
| මාවනැල්ල | 9206 | |
| අරණායක | 9209 | |
| කෑගල්ල | 9212 | |
| ගලිගමුව | 9215 | කෑගල්ල |
| වරකාපොල | 9218 | |
| රුවන්වැල්ල | 9221 | 25 |
| බුලත්කොහුපිටිය | 9224 | |
| යටියන්තොට | 9227 | |
| දෙහිඕවිට | 9230 | |
| දැරණියගල | 9233 | |

02-362

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.